# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/44 – 2022 පෙබරවාරි මස 22 වැනි අඟහරුවාදා – 2022.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 835, කුරුණෑගල නගරය නැගෙනහිර, අංක 836, තෙලියාගොන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, පහළ ගැට්ටුවාන තෙලියාගොන්න ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KRN/2021/22 හා 2021.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් වූ ඉඩම් කැබලි:

01. **කැබලි අංක 01 – මීගහදළුපොතේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0350**

උතුරට: දුලානි තිලකරත්න සහ තවත් අය හිමිකම් කියන මීගහදළුපොතේ කුඹුර සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ මෙම අනුරේඛනයේ කැබලි අංක 2; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 2, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන කොටකන්ද දුලානි තිලකරත්න සහ තවත් අය හිමිකම් කියන මීගහදළුපොතේ කුඹුර.

02. **කැබලි අංක 02 – කොටකන්ද – ප්‍රමාණය: හෙක්. 0.0199**

උතුරට: ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන කොටකන්ද සහ දුලානි තිලකරත්න සහ තවත් අය හිමිකම් කියන මීගහදළුපොතේ කුඹුර; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 1 සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ මෙම අනුරේඛනයේ කැබලි අංක 3; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 3, ධීවර සංස්ථා පාර සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන කොටකන්ද.

03. **කැබලි අංක 03 – ධීවර සංස්ථා පාර – ප්‍රමාණය: හෙක්. 0.0123**

උතුරට: ධීවර සංස්ථා පාර, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන කොටකන්ද සහ මෙම අනුරේඛනයේ කැබලි අංක 2; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 2 සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ මෙම අනුරේඛනයේ කැබලි අංක 4; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 4, පූජ්‍ය දෙබත්ගම පියසුමන හිමි හිමිකම් කියන කොටකන්ද කුඹුර සහ ධීවර සංස්ථා පාර.


1A – G36166 – 25 (2022/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. **කැබලි අංක 04 – කොටකන්ද කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0214**

උතුරට: පූජ්‍ය දෙබත්ගම පියසුමන හිමි හිමිකම් කියන කොටකන්ද කුඹුර සහ ධීවර සංස්ථා පාර සහ මෙම අනුරේඛනයේ කැබලි අංක 3; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 3 සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ පූජ්‍ය දෙබත්ගම පියසුමන හිමි හිමිකම් කියන කොටකන්ද කුඹුර; බටහිරට: පූජ්‍ය දෙබත්ගම පියසුමන හිමි හිමිකම් කියන කොටකන්ද කුඹුර.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2020/HW/166.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 - 0606

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 808, වෙහෙරබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අම්බලන්පිටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KRN/2021/21 හා 2021.04.24 දිනැති පුගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 01 – කොලපැලැල්ලකන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0853**

උතුරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ රෝයල් අන්තර්ජාතික පාසල; නැගෙනහිරට: රෝයල් අන්තර්ජාතික පාසල සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

02. **කැබලි අංක 02 – කොලපැලැල්ලකන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0101**

උතුරට සහ නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2020/HW/204.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 - 0607

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.